# සාම්ප්‍රදායික හේන් ගොවිතැන හා බැඳී උරුමයේ වර්තමාන ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.එම්.එච්.පී.ජේ.කේ. වීරසිංහ[1]

මුඛ්‍ය පද: හේන් ගොවිතැන, උරුමය, සාම්ප්‍රදායික, කෘෂි ආර්ථිකය

## හැඳින්වීම

පෞඪ කෘෂි ආර්ථිකයකට උරුමකම් කී ලක්දිව අතීත මුතුන් මිත්තන් ගොඩ මඩ ගොවිතැන උපයෝගී කරගනිමින් ජන ජීවිතය ශක්තිමත් කරගන්නා ලදී. එහි දී මඩ ගොවිතැන වශයෙන් කුඹුරු ගොවිතැන සහ ගොඩ ගොවිතැන වශයෙන් හේන් ගොවිතැන සිදු කල බව සඳහන් වේ. හේන් ගොවිතැන ගැමි ජන ජීවිතයේ පදනම වූ අතර මධ්‍යම, ඌව, දකුණු, උතුරු, උතුරු මැද, නැගෙනහිර ආදී පළාත් රැසක වර්තමානයේ දී සිදු කරනු ලබයි. මෙම පර්යේෂණ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දඩයම්පොළ ග්‍රාමය කේන්ද්‍ර කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි. මෙම හේන් ගොවිතැන හේතුවෙන් ග්‍රාමීය ජන ජීවිතය උසස් වීමට හේතු වී ඇති බව හඳුනාගත හැකි අතර කෙසේ වුවත් නූතනත්වය හමුවේ හේන් ගොවිතැන හා බැඳී උරුමය වියැකී යමින් පවතින බව නිරීක්ෂණය කළ හැකිය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වනුයේ නූතනත්වය හමුවේ සාම්ප්‍රදායික හේන් ගොවිතැන හා බැඳී උරුමයේ වර්තමාන ස්වභාවය කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීමයි. එමෙන්ම වර්තමානයේදී සාම්ප්‍රදායික හේන් ගොවිතැනේ ස්වභාවය විමර්ශණය කිරීම මූලික අරමුණ වේ.

## ක්‍රමවේදය

එම පර්යේෂණ ගැටළු සාධනය කරගැනීම සඳහා දත්ත ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය ක්‍රම යොදාගන්නා ලදී. එහිදී හේන් ගොවිතැන හා සම්බන්ධ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම සිදු කළහ. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය උපයෝගී කර ගැනීම සිදු කළ අතර දත්ත ඉදිරිපත් කිරීම සඳහා විශ්ලේෂණාත්මක කථන ක්‍රමවේදය සහ ඡායාරූප භාවිත කරනු ලැබේ.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Weerasinghemalisha054@gmail.com

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

අතීතයේ දී පස, දේශගුණය සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් උචිත පරිදි හේන් ගොවිතැන සිදු කිරීමේ සාම්ප්‍රදායික දැනුම සහ තාක්ෂණය ගැමියා තුල පැවතියද වර්තමනයේදී එම දැනුම හා තාක්ෂණය භාවිතය දක්නට නොලැබේ. කෙසේ වුවත් අතීතයේ දී මෙන් ම වර්තමානයේ දී හේන් ගොවිතැන නියමිත කාල සීමාවකට සිදු කිරීමට අධ්‍යයන ප්‍රදේශයේ ගැමියන් උත්සුකු වේ. ඒ අනුව කැළෑ එළිපෙහෙළි කිරීම නිකිණි මස සිදු කරන අතර කැළය පිළිස්සීම එම මස අවසානයේ දී සිදු කරනු ලබයි. අනතුරු බිනර මස ආරම්භයත් සමඟම වැටවල් සැකසීම සහ බිම් සැකසීම සිදු කරනු ලබයි. බීජ සිටුවීම වප් පසළොස්වක පොහෝය එළැඹීමත් සමඟ ම සිදු කරනු ලබන ගැමියා විසින් අස්වනු නෙලීම දුරුතු, නවම්, මැදින් මස තුල සිදු කරයි.

අතීතයේ දී මෙම ග්‍රාමයේ හේන් කෙටීම පවුල් තිහක් පමණ සිදු කළද නූතනත්වය හමුවේ නිරත වන පවුල් සංඛ්‍යාව දහයක් පමණ අවම මට්ටමකට සීමා වී පවතී. සාමුහික වශයෙන් හේන් කෙටීම අතීතයේ සිදු කලද වර්තමානයේදී එම සමූහිකත්වය දක්නට ඇත්තේ ඉතා අල්ප වශයෙනි. නවදැලි හේන, අක්දඬුවා හේන සහ මුකලන් හේන වශයෙන් සාම්ප්‍රදායික ගත් කළ හේන් වර්ග කිහිපයක් හඳුනාගත හැකි වුවද වර්තමානයේදී එම හේන් වර්ග හඳුනාගත නොහැකිය. මන්ද යත් හේන් කෙටීමේ දී ගැමියන් විසින් වඩා පහසුවෙන් ලඟා විය හැකි පහසු භූමියක් තළ අඛණ්ඩව වසර කිහිපයක් එම භූමිය භාවිතා කිරීම සුලභව දක්නට ලැබේ.

අක්වැස්ස ලැබීමෙන් පසුව බීජ වැපිරීම සාම්ප්‍රදායික වශයෙන් ගැමියා අතීතයේ දී මෙන් ම වර්තමානයේ දී සිදු කරනු ලබයි. සාම්ප්‍රදායික හේන් ගොවිතැන තුළ බඩ ඉරිඟු, මෑ, වට්ටක්කා, කුරහන්, කැකිරි, පුහුල්, ලබු වර්ග වගා කල ද වර්තාමනයේ දී බඩඉරිඟු, කුරක්කන්, වට්ටක්කා, බටු, මිරිස්, බෝංචි, කැරට් වැනි එළවලු වර්ග වගා කිරීමට යොමු වී තිබේ. එමෙන්ම හේනේ ආරක්ෂාව සඳහා පැලක් තැනීම, ටකපෝරුව, කැට පොල්ල, කොටි පත්ත, පඹයන් බැඳීම සාම්ප්‍රදායික හේන් ගොවිතැන ආශ්‍රිතව අතීතයේදී සිදු කළ ද නූතනත්වය හමුවේ එම සාම්ප්‍රදායික දැනුම හා තාක්ෂණය භාවිතය වියැකී යමින් පවති. මෙහි දී වර්තමානයේදී පැල් තැනීම, පඹයන් බැඳීම සිදු කරයි. සාම්ප්‍රදායික හේන් ගොවිතැන අතීතයේ දී බහු බෝග වගාව, කාබනික පොහොර භාවිතය, කෘමි විකර්ෂක මල් වර්ග සිටු වීම කලද නූතනයේ දී බහු බෝග වගාව සම්පූර්ණයෙන් ම වෙනස් වී පවතී. එමෙන් ම කෘෂි රසායනික පොහොර සහ දියර භාවිතය බහුලව හඳුනාගත හැකිය.

සාම්ප්‍රදායික හේන් ගොවිතැන නූතයේදී විවිධ හේතු සාධකයන් මත වෙනස්වීම් වලට භාජනය වී ඇත. නිශ්චිත කාලසීමාවකට හේන් ගොවිතැන සිදු කිරීම පැහැදිළි ව හඳුනාගැනීමට නොහැකි අතර ඒ සඳහා කාලගුණ හා දේශණික වෙනස්වීම් ද සාම්ප්‍රදායික දැනුම සහ ගුණධර්ම වියැකී යාමද හේතු වී ඇති බව තහවුරු වේ. මීට අමතරව අතීතයේ දී අධ්‍යයන ප්‍රදේශය සාම්ප්‍රදායික හේන්

ගොවිතැන පැවතිය ද වර්තමාන නිතී රෙගුලාසි සහ ජනගහනය වර්ධනය සමග කෘෂි ඉඩම් මෙන්ම හේන් ගොවිතැන් කරන්නන් ප්‍රමාණය අවම වීමද ප්‍රබල හේතු සාධකයක් වී ඇත.

සාම්ප්‍රදායික හේන තුල බහු භෝග වගා සිදු කල ද වර්තමානයේදී එළවලු වර්ග බහුතරක් වගා කිරීමට යොමු වීම ආර්ථිකය ශක්තිමත් කරගැනීමට ගැමියා ගත් උත්සාහයක් වශයෙන් හඳුනාගත හැකිය. එමෙන් ම වන සතුන්ගෙන් වන හානි අවම කරගැනීමට සාම්ප්‍රදායික දැනුම හා තාක්ෂණය භාවිතා කළ ද වර්තමානයේ දී  සතුන්ගෙන් එල්ලවන හානි ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීමෙන් ඇතැම් අවස්ථාවන්හි විදුලි රැහැන්  ඇදීම වැනි අනාරක්ෂිත ක්‍රමවේද භාවිතා කරනු ලබයි. එමෙන් ම හේන් ගොවිතැන මඟින් වැඩි අස්වැන්නක් සහ කෘමි  උවදුරු මෙන් ම ලෙඩ රෝග වළක්වා ගැනීම සඳහා කෘෂි රසායනික පොහොර සහ බෙහෙත් භාවිතයට යොමු වී ඇත.

## සමාලෝචනය

මේ අනුව සාම්ප්‍රදායික හේන් ගොවිතැන හා බැඳි උරුමයේ වර්තමාන ස්භාවය විමර්ශණය කිරීමේ දී මෙම අධ්‍යයනය ප්‍රදේශය සහ සමස්ත හේන් ගොවිතැන සාම්ප්‍රදායික දැනුම හා තාක්ෂණය වියැකී යමින් පුළුල් පරිවර්තනයට ලක් වී ඇති බව හඳුනාගත හැකිය. ඒ සඳහා සමාජ, දේශපාලන, ආර්ථික සාධකයන් හේතු වී ඇති බව නිගමනය කල හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍රය

දළුපොත, මහින්ද. (2002). ***හේනේ වගතුග.*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, පී. (2011). ***හේනේ විත්ති.*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

## සම්මුඛ සාකච්ඡා

පියසේන, ඩබ්ලිව්.එම්. (2025). සාම්ප්‍රදායික හේන් ගොවිතැන පිළිබඳව. එච්.පී.ජේ.කේ. වීරසිංහ, 2025/04/05

ජයවීර, ඊ.ඒ. (2025). සාම්ප්‍රදායික හේන් ගොවිතැන පිළිබඳව. එච්.පී.ජේ.කේ. වීරසිංහ, 2025/04/06